සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 25. 07. 2023 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>අස්වැසුම ප්‍රතිලාභීන්ගේ තහවුරු කරගෙන ඇති බැංකු ගිණුම් සම්බන්ධයෙන් මතුව ඇති ගැටළු විසඳීම</u>

සංගණන අවස්ථාවේදී ඉදිරිපත් කර තිබූ අස්වැසුම සුදුසුකම්ලාභී පවුල් වල අයදුම්කරුගේ හෝ අයදුම්කරු වෙනුවෙන් එම පවුලේ සාමාජිකයකුගේ බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු අදාල බැංකු මගින් තහවුරු කරගෙන පරිගණක පද්ධතියේ "Verified" වශයෙන් දක්වා ඇත.

එහෙත් මෙම ගිණුම් අතුරින් සමහර ගිණුම් සම්බන්ධයෙන් පහත සඳහන් ගැටළු පැනනැගී ඇති බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වාර්තාවී ඇත.

I. බැංකු ගිණුම් හිමි පුද්ගලයා දැන් මියගොස් ඇත.
II. බැංකු ගිණුම් හිමි පුද්ගලයා විදේශගතව ඇත.
III. බැංකු ගිණුම් හිමි පුද්ගලයා පවුලෙන් නීත්‍යානුකූලව වෙන් වී ඇත.
IV. බැංකු ගිණුම් හිමි පුද්ගලයා බාලවයස්කාරයකු වීම.
V. බැංකු ගිණුම් හිමි පුද්ගලයා මානසික ආබාධ සහිත තැනැත්තෙකු වීම.
VI. වැරදීමකින් වෙනත් පුද්ගලයකුගේ බැංකු ගිණුම් අංකයක් සඳහන් කර තිබීම.
VII. දී ඇති ගිණුම් අංකය නිවැරදි නොවීම.
VIII. පිළිගත නොහැකි (සමෘද්ධි බැංකුව වැනි) මූල්‍ය ආයතනයක විවෘත කර ඇති ගිණුම්.
IX. දැනට වසා දමා ඇති ගිණුම්.
X. ලබා දී තිබූ අංකය පිළිබඳ අයදුම්කරුට පැහැදිලිතාවයක් නැති නිසා නව ගිණුමක් විවෘත කිරීමට ඉල්ලා සිටීම.

දැනට පරිගණක පද්ධතිය තුල "Verified" වශයෙන් දැක්වෙන බැංකු ගිණුම් සම්බන්ධයෙන් ඉහත සඳහන් ආකාරයේ ගැටළුවක් මතු වී ඇති බවට වාර්තාවන්නේ නම් පහත සඳහන් පරිදි ක්‍රියා කරන මෙන් කාරුණිකව දන්වමි.

අදාල ගැටළු පිළිබඳව විමර්ශනයක් පවත්වා අවශ්‍ය ලියකියවිලි හා සාධක මගින් ගැටළුව තහවුරු කර ගත යුතුයි. ඊට පාදක කරගත් ලියකියවිලි වල පිටපත් සමග පහත සඳහන් ඔබේ නිර්දේශ ගැටළුවට අදාල පරිදි කරුණාකර මා වෙත එවන්න.

i. ඉහත අංක i සිට v දක්වා ගැටළු සම්බන්ධයෙන් අදාල තත්වය (උදා:- මියගිය බව, විදේශගතව ඇති බව) සනාථ කරන බවත් පවත්නා ගිණුම වෙනුවට පවුලේ සුදුසු වෙනත් තැනැත්තෙකුගේ නමින් (නිශ්චිතව නම සඳහන් කර) නව ගිණුමක් විවෘත කිරීම සුදුසු බවත් නිර්දේශ කිරීම.

ii. ඉහත අංක vi සිට x දක්වා ගැටළු සම්බන්ධයෙන් අදාල තත්වය සනාථ කරන බවත් ඒ අනුව එම ගිණුම වෙනුවට නව ගිණුමක් රජයේ බැංකුවක විවෘත කිරීම සුදුසු බවත් නිර්දේශ කිරීම.

මෙවැනි ගැටළු ඉදිරිපත්වන ආකාරයට එක් රැස්කර පරීක්ෂණ මගින් තහවුරු කරගෙන ලේඛනයක් ලෙස සකස් කර එවීමට හැකියාවක් ඇත. ඒ සඳහා අමුණා ඇති ආකෘතිය භාවිතා කල හැක. ඒ අනුව, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ කාර්යය මණ්ඩලය විසින් පරිගණක පද්ධතියේ අවශ්‍ය දත්ත සංශෝධනය කර නව ගිණුමක් විවෘත කිරීමට ඉඩ සලසා දෙනු ලැබේ. ඉන්පසුව ඔබ විසින් නව ගිණුමක් විවෘත කිරීමට අදාල ලිපිය නිකුත් කළ හැකි බව දන්වමි.

ආර්.පී.ආර් රාජපක්ෂ
අතිරේක කොමසාරිස් (මෙහෙයුම්)
කොමසාරිස් වෙනුවට.

**පිටපත :- දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත - කා.දැ.ස.**

| HH අංකය (ගෘහ ඒකක අංකය) | සුදුසුකම්ලාභී අයදුම්කරුගේ නම | ගිණුම් හිමියාගේ නම | පවත්නා ගිණුම් අංකය | ගැටළුව | ගැටළුව සනාථ කිරීමට අදාල කරගත් ලියකියවිලි/වාර්ථාව | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

.........................................

ප්‍රාදේශීය ලේකම්

නිල මුද්‍රාව